සන්නස SANNASA




# විභාගෙ විභාගේ

## රහස්‍ය භාවය නිසාම හෙළිදරව් නොවන විභාගවල අම්හිරි අත්දැකීම් ....... 2

**අපේ විභාග වලදී වංචා සහගත කටයුතු කිරීමට නොහැකි වන ලෙස සෑම හිඩැසක්ම වැසීමට පියවර ගෙන තිබේ. එහෙත් සමහර අවස්ථාවලදී, විභාග කාර්ය මණ්ඩලයේ අපරීක්ෂාකාරී කම් නිසා වැරදි සිදුවිය හැකිය. ක්‍රම වත් ලෙස නිරීක්ෂණ කටයුතු කරන නිලධාරීන් විසින් එවැනි වැරදි කළ අය හඳුනාගත් අවස්ථාද එමටය. මෙයින් කිහිපයක් පහත දැක්වේ.**

1. විභාග ශාලාවේදී උත්තර පත්‍ර වංචා ලෙස මාරු කර ගැනීම

මෙය නිතර අසන්නට ලැබෙන විභාග වංචාවකි. මා ශාලාධිපති ලෙස අධීක්ෂණ කටයුතු වල යෙදුන මධ්‍යස්ථානයක මෙවැන්නක් සිදුවිය. එය අපොස සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි විෂයය විය. විභාගය ආරම්භ වී පැය භාගයකට පමණ පසු මා සිටි ස්ථානයට ආසන දහයක් පමණ ඉදිරි ආසනයේ සිටි සිසුවා, ඔහුට පිටුපස ආසනයේ සිටි සිසුවාට කඩදාසියක් දුන් අතර එය ලබාගත් සිසුවා, එම කඩදාසිය තම ලියන කඩදාසි ගොනුව යටින් තබා ගත්තේය.

මෙය දුටු මා කඩදාසිය ලබාගත් සිසුවා වෙත ගොස් ඩෙස්කුවේ ලියා ඇති විභාග අංකය පරීක්ෂා කරන නියාවෙන් ඔහුගේ පිළිතුරු පත්‍ර වල අංක පෙරලා බැලූවෙමි. යටම තිබුණු කඩදාසියේ දමා තිබුණු විභාග අංකය වෙනස්ය. එය ඔහුගේ අංකය නොවුනි. එම කඩදාසිය මා භාරයට ගෙන පැමිණීමේ ලේඛනය සහ ලකුණු ලේඛනය සමග සසඳා බැලීමි. එය ඉදිරියෙන් සිටින සිසුවාගේ අංකයයි. එම කඩදාසියේ පිටු භාගයක පමණ වාක්‍ය රචනාවක් ලියා තිබිණ. විභාග ශාලාවෙන් පිටවී යාමට පෙර ඔවුන් දෙදෙනාටම මා හමුවන ලෙස ඉතාමත් මිත්‍රශීලීව දැන්වීමි.

තමන් විසින් ලියන ලද වාක්‍ය රචනාව තමාට පිටුපස ආසනයේ සිටි අයදුම්කරුට දුන් බව අදාළ ශිෂ්‍යයා පිළිගත් නමුත්, තමා එය නොඉල්ලූ බව දෙවැන්නා ප්‍රකාශ කළේය. දෙදෙනාගෙන්ම ප්‍රකාශ ලබාගතිමි. තම වාක්‍ය රචනාව අනිකාට දුන් සිසුවාගේ උත්තර පත්‍රයේ රචනාවක් නොවීය. මේ සම්බන්ධයෙන් ආවරණ ලිපියක් සකස්කර



සිසුන් විසින් අවසන් කරන ලද පිළිතුරු පත්‍ර දෙකත්, ඔවුන්ගෙන් ලබාගත් ප්‍රකාශන සහ සිද්ධිය සත්‍ය බවට නිරීක්ෂක වරුන් දෙදෙනෙකුගේ අත්සනද සහිතව, වෙනම කවරයක බහා, ආවරණ ලිපියක්ද සමග විභාග දෙපාර්තමේන්තුවේ විමර්ශන ශාකාවට යැවීම සඳහා පියවර ගන්නා ලදී. මෙම විස්තර සියල්ල සඳහන් කර ජර්නල් සටහනක්ද තැබීමි.

විමර්ශනයකින් පසු මෙවැනි අකටයුත්තක් සිදුවී ඇති බවට ඔප්පු වුවහොත් අදාළ අයදුම් කරුවන්ට වසර කිහිපයක විභාග තහනමකට යටත් වීමට සිදුවේ.

2. අයදුම් කරු වෙනුවට වෙනත් අයෙකු පිළිතුරු ලිවීම (impersonation)

විභාගයකදී, නියමිත අයදුම්කරු වෙනුවට වෙනත් අයෙකු ප්‍රශ්න පත්‍රඅයකට පිළිතුරු සැපයීම බරපතල වංචාවක් ලෙස දැක්විය හැකියි. මෙවැනි සිද්ධි කලාතුරකින් වාර්තාවේ. මා සමග සේවය කළ සහෝදර නිලධාරියෙකු අපොස සාමාන්‍ය පෙළ විභාග යේදී එවැනි සිද්ධියකදී කටයුතු කර ඇති ආකාරය මෙහි දක්වමි. එදින තිබී ඇත්තේ ගණිත ප්‍රශ්න පත්‍රයයි. එක්තරා විභාග ශාලාවක (කොළඹට ආසන්න) මෙවැනි වංචා සහගත ක්‍රියාවක් සිදුවන බවට විභාග දෙපාර්තමේන්තුවට ටෙලිෆෝන් පණිවුඩයක් ලැබී ඇත. එය පෞද්ගලික අයදුම් කරුවන් විභාගයට පෙනී සිටින මධ්‍යස්ථානයකි. විභාග පැවැත්වෙන සෑම විටකම, විභාග ශාලාවල ඇතිවිය හැකි ඕනෑම ගැටලුවකට පිළියම් සෙවීම සඳහා පළපුරුදු නිලධාරීන් කිහිප දෙනෙකු සූදානමින් සිටීම සිරිතකි.

නිලධාරීන් දෙදෙනෙකු වහාම එම මධ්‍යස්ථානයට ගොස් තිබේ. විභාගය මැනවින් පැවැත්වෙන අතර සිද්ධිය පිළිබඳව ශාලාධිපති වරයා කිසිවක් දැන නොසිටියේය. ඒ කාලයේ වැඩිපුරම තිබුණේ තැපෑල් කාර්යාල හරහා ලබාගත් හැඳුනුම් පත්‍ය. අයදුම්කරු හඳුනා ගැනීම සඳහා, ඉදිරිපත් කරණු ලබන හැඳුනුම් පතෙහි ඇති ඡායාරුපය, එය දරණ පුද්ගලයාගේමද යන්න තහවුරු කිරීම විභාග ශාලාධිපතිට අයිති රාජකාරි කොටසකි. කෙසේ වෙතත් විභාග අපේක්ෂකයින්ට කරදරයක් නොවන ලෙසට මෙය කළයුතු වේ.

විමර්ශනය සඳහා විභාග මධ්‍යස්ථානයට ගිය නිලධාරින් විසින් සියලූම නිරීක්ෂක වරුන්ට අවශ්‍ය උපදෙස් දී, තමතමන්ට නියමිත අයදුම්කරුවන්ගේ හැඳුනුම්පත් හොඳින් පරීක්ෂා කර, සියල්ල අනු පිළි වෙළට එකතු කරගෙන එන ලෙස දන්වා තිබේ. පැය භාගයකදී පමණ සියලූම හැඳුනුම්පත් විභාග දෙපාර්තමේන්තු නිලධාරින් දෙදෙනා අතට ලැබුණි. මේවා නැවත පරීක්ෂා කිරීමේදී තැපෑල් කාර්යාල හැඳුනුම් පත් අතර ලැමිනේට් කරන ලද හැඳුනුම් පතක් දකින්නට ලැබී ඇත. එය හොඳින් පරික්ෂා කිරීමේදී හැඳුනුම් පත් දෙකක් හරි මැදින් සිරස්ව කපා එකක මුල් කොටස සහ අනිකේ දෙවෙනි කොටස (ඡායාරූපය සහ අත්සන) එකට තබා, ඉතාමත් සියුම් ලෙස ලැමිනේට් කර ඇති බව පෙනී ගොස් තිබේ. වංචාව හසුවිය

ඉදිරි පියවර ගෙන ඇත්තේ මෙසේය. අදාළ සිසුවාගේ හැර අන් අයගේ හැඳුනුම් පත් ආ පසු නිවැරදිව බෙදා දුනි. සැකකාර සිසුවාට කථා කර ඔහු කර ඇති බරපතල වරද තේරුම් කර දී, ඔහුගේ තොරතුරු සහ ව්‍යාජ අයදුම්පත පොලීසිය හරහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙන ලදී.

ගණිත විෂයය තිබුණේ තුන්වෙනි විභාග දිනයේය. ඔහු පෙනී සිට ඇත්තේ ගණිතය සඳහා පමණකි.

මෙම පුද්ගලයා අයදුම් පතෙහි සාමාන්‍ය තොරතුරු සහිත කොටසෙහි විස්තර සඳහන් අය වෙනුවෙන් විභාගයට පිළිතුරු සපයන ලද්දේ තමාගේ හැඳුනුම් පතෙහි තම ඡායාරූපය සහිත කොටස එකට බද්ධ කර ලැමිනේට් කර ගැනීමෙනි. හැඳුනුම් පතෙහි මුල් කොටස පමණක් අයිති තැනැත්තා විධිමත් අයදුම් කරුය. මෙවැනි බරපතල වරදක් කරන අයට, උසාවිය මගින් නඩු පවරන අතර වසර හත අටක විභාග තහනමක්ද ක්‍රියාත්මක වේ. නියම අයදුම් කරුටද විභාග තහනමකට මුහුණ පෑමට සිදුවේ.

3. කලින් නිකුත් කල විභාග කඩදාසියක ලියාගෙන ආ පිළිතුරු පැමිණීම

විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන විභාග වල පිළිතුරු සැපයීම සඳහා විශේෂ කඩදාසියක් සපයනු ලැබේ. මේවා බෙදා දීමට පෙර නිරීක්ෂක වරයෙකු විසින් කෙටි අත්සන තබා, දිනය දැමිය යුතුය.

අපොස උසස් පෙළ විභාගයක අයදුම් කාරියක් විසින් කලින් ලියාගෙන එන ලද කඩදාසියක් උත්තර පත්‍රයට අමුණා තිබීම විභාග ශාලාධිපතිවරයෙකුට හසුවී තිබේ. එය ආර්ථික විද්‍යාව විෂයයයේ උත්තර පත්‍රයකි. විභාග මධ්‍යබස්ථානයේ පෞද්ගලික අයදුම්කරුවන් පමණකි. සාමාන්‍යයෙන් විභාගයක් පැවැත්වෙද්දී වරින් වර කාලය පිළිබඳව දැනුම දීම සිරිතකි. එදින ප්‍රශ්න පත්‍රයේ කාලය අවසන් වීමට විනාඩි කිහිපයක් තිබියදී ඒ බව දැනුම් දී, ලියන ලද කඩදාසි සියල්ලම අනු පිළි වෙලට ගොනු කර අමුණා ගැට ගසන ලෙස කිහිප වරක්ම උපදෙස් දෙන ලදී.

එක් පන්ති කාමරයක සිටි ශිෂ්‍යාවක් ඕනෑ කමින්ම වාගේ අවසාන විනාඩි කිහිපය මිඩංගු කර කුඩාවට නමා තිබුණු කඩදාසියක් දිග හැර උත්තර පත්‍ර ගොනුවේ යටින්ම තබා ගැට ගසා උත්තර පත්‍රය නිරීක්ෂක වරිය අතට දී ඉක්මනින්ම ශාලා වෙන් පිටවී ගොස් ඇත. නිරීක්ෂක වරිය මෙය ශාලාධිපතිට දැන්වූවාය. උත්තර පත්‍රය පරීක්ෂා කිරීමේදී එහි අවසාන පිටුව කලින් දිනයක බෙදාදුන් කඩදාසිය ක් වූ අතර එය නමා තිබුණු ලක්ෂණද පැහැදිලිව දකින්නට ලැබුණි. නිරීක්ෂක වරිය ශාලාවෙන් පිටතට පැමිණ ශිෂ්‍යාව ගැන සොයා බැලූවත් ඒ වන විටත් ඇය පිටවී ගොස් තිබිණ. උත්තර පත්‍රය පරීක්ෂා කිරීමේදී, එය කලින් දිනයක නිකුත් කළ අනවසරයෙන් පිටතට ගෙනයන ලද විභාග කඩදාසියක ලියන ලද, සම්පූර්ණ ප්‍රශ්නයක ටම ගැලපෙන පිලිතුරක් බව හෙළිවිය. එහි අයදුම්කාරියගේ අංකයද ලියා තිබුණි.

මෙය වාර්තා කළයුතු බරපතල වරදකි. ශාලාධිපති විසින් එම උත්තර පත්‍රය ආවරණ ලිපියක්ද සහිතව විභාග දෙපාර්ත මෙන්තුවේ විමර්ශන ශාඛාවට යොමුකර ජර්නල සටහනක්ද තබා තිබේ. මෙයද වසර කිහිපයක් විභාග තහනමකට ලක් විය හැකි වරදකි.



දයාරත්න වීරසේකර
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික, නියෝජ්‍ය විභාග කොමසාරිස්



සන්නස ගැන ඔබේ අදහස් අපට ලියන්න.

Sannasa, Suite 504, 530 Little Collins Street, Melbourne 3000

Via Sannasa Website:
Visit www.sannasa.com.au